# විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යයන අවශ්‍යතා සපුරා ගැනීමේදී සමාජ ජාල වෙබ් අඩවි භාවිතය පිළිබඳ අධ්‍යයනයක්: කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**පී. සී. ආර්. සෝමරත්න [1]**
**කේ. ඒ. ටී. චාමර [2]**

**සංක්ෂේපය**

සන්නිවේදනය, විනෝදාස්වාදය මූලික කරගෙන සමාජ ජාල වෙබ් අඩවි භාවිත කරනු ලැබුවත්, අද වන විට එය අධ්‍යයන අවශ්‍යතා සපුරා ගැනීමේ මෙවලමක් ලෙස ද භාවිත කිරීමේ හැකියාව ඇත. සමාජ ජාල වෙබ් අඩවි භාවිතය ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාව තුළ ද බොහෝමයක් පිරිසකගේ දෛනික චර්යා අතර මූලික කොටසක් බවට පත්ව ඇත. එසේම විශ්වවිද්‍යාල සිසුන්ගේ ද භාවිතයේ වැඩි නැඹුරුතාවක් දක්වනු ලැබේ. මෙම අධ්‍යයනයේ අරමුණු වූයේ විශ්වවිද්‍යාල සිසුන් තම අධ්‍යයන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සමාජ ජාල භාවිතය පිළිබඳව අධ්‍යයනය කිරීමයි. සෙසු අරමුණු ලෙස භාවිත කරන්නා වූ සමාජ ජාල හඳුනා ගැනීම හා කුමන අධ්‍යයන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සමාජ ජාල භාවිත කරන්නේ ද යන්න හඳුනා ගැනීම දැක්විය හැකිය. මානව ශාස්ත්‍ර, සමාජයීය විද්‍යා, විද්‍යා හා වානිජ හා කළමනාකරණ පීඨ නියෝජනය වන පරිදි කැලණිය විශ්වවිද්‍යාලයේ සමස්ත පළමු, දෙවන, තෙවන හා සිව් වන වසරසිසුන් අතරින් සරල සසම්භාවී නියැදි ක්‍රමය යටතේ ප්‍රශ්නාවලී මඟින් හා සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත රැස් කරන ලදි.

විශ්වවිද්‍යාල සිසුන් තම අධ්‍යයන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සමාජ ජාල කෙරෙහි බහුලව නැඹුරු වී ඇති බවත් ප්‍රධානතම ලෙස Facebook සමාජ ජාලය යොදා ගනු ලබන බවත් ඉන් පසුව Google+, Twitter ආදි සමාජ ජාල වෙබ් අඩවි භාවිත කරනු ලබන බවත් අනාවරණය විය. පැවරුම් අවශ්‍යතා සඳහා, තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සමාජ ජාල ප්‍රධාන වශයෙන් භාවිත වන බව නිගමනය විය. ඊට අමතරව Vedio, Audio ආදිය ලබා ගැනීම සඳහාත්, අධ්‍යාපනික සම්පත් හුවමාරුවටත් සමාජ ජාල බහුල ලෙස භාවිත කරනු ලැබේ. සමාජ ජාල අධ්‍යයන කටයුතු සඳහා භාවිත කිරීමේදී සිසුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වනුයේ අන්තර්ජාලය හා සම්බන්ධ වීමේ දී ඇති වන ගැටලුය . අධ්‍යයන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සමාජ ජාල වෙබ් අඩවි භාවිත කිරීමේ දී බහුතර විශ්වවිද්‍යාල සිසුන් තෘප්තිමත්භාවයට පත් නොවන බවත් මේ තුළින් නිගමනය කර ගැනීමට හැකි විය.

වෙනස් වන තාක්ෂණික ලෝකයත් සමඟ සාම්ප්‍රදායික අධ්‍යයන රටාවෙන් වෙනස් වූ ක්‍රම වේදයන් තුළින් ඉගෙනීමේ හා ඉගැන්වීම් රටා දියුණු කිරීමේ අවස්ථාව සමාජ ජාල තුළින් ලැබී ඇති නිසා අධ්‍යයන ක්‍රියාවලිය වඩ වඩාත් සාර්ථකත්වයට පත් කර ගැනීමේ අවස්ථාව උදා වී ඇත.

**ප්‍රමුඛ පද** - සමාජ ජාල, විශ්වවිද්‍යාල සිසුන්, අධ්‍යයන අවශ්‍යතා, සමාජ ජාල වෙබ් අඩවි

*1. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* chethikarathnamali@gmail.com

*2. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* chamara@kln.ac.lk